FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහසː නිරීක්ෂණ වාර්තාව
# ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
# Media Freedom Rights Monitoring Report

MFRMD

2022 ජනවාරි

2 වන වෙළුම - කලාප අංක 1



මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට බාධා



ප්‍රගීත් එක්නැලිගොඩ වෙනුවෙන් යුක්තිය ඉල්ලා සන්ධ්‍යා එක්නැලිගොඩ හිස මුඩු කරයි.



රංගන ශිල්පී සුදත්ත තිලකසිරිගෙන් සීඅයිඩී ය ප්‍රශ්න කරයි.

## සමාජ අර්බුද යුගයන්හිදි මාධ්‍ය නිදහස වැදගත් සමාජ පරිවර්තනීය කාර්යභාරයකට දායක වෙයි.

**- Global Campus of Human Rights -** *Twitter message*

පසුගිය දශක කිහිපය තුළ සෑම පුරවැසියෙකුටම මානව හා මූලික අයිතිවාසිකම් සඳහා සමාන ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා කළ මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අයිතිවාසිකම් යුගයක් කරා අපි එළඹ සිටියෙමු. "අන්තර්ජාතික, පරම අයිතිවාසිකම් පනත" ලෙස සැලකෙන මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1945) සිවිල් දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය (1967) ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය (1967) හා ඊට අඩංගු වෛකල්පික ප්‍රොටෝකෝල විසින් ප්‍රකාශයට පත් කොට ඇති මානව හිමිකම් ද ඊට සමාන්තරව ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඇතුළත් මූලික අයිතිවාසිකම් සමූහය විඳීමේ අවකාශය ක්‍රමයෙන් පුළුල් කොට ගැනීම අයිතිවාසිකම් යුගයේ පුරවැසි ජයග්‍රහණය ලෙස හැඳින්විය හැකිය.

එසේ වුවද වර්ධනය වන සමාජ, ආර්ථික, දේශපාලනික, පාරිසරික මෙන්ම සෞඛ්‍ය අර්බුද හමුවේ පුරවැසි නිදහසේ නිම්වළලු හකුළන නීති රීති හා භාවිතයන්ද, රාජාණ්ඩුවාදය යළි සිහිපත් කරවන බලධාරීන්ගේ කේවලාත්මක තීන්දු තීරණ ද විසින් අයිතිවාසිකම් හා යුගයේ ජයග්‍රහණ අභියෝගයට ලක් කොට තිබේ.

පුරවැසියන්ට අර්බුද තුළින් යළි නැගී සිටීමට මාධ්‍ය නිදහස මෙලමක් ලෙස ඉතිහාසය තුළ ඉටු කළ කාර්යභාරය නිදහස් මාධ්‍ය ව්‍යාපාරය යළි සිහිපත් කරයි. නිදහසේ නිම්වළලු පුළුල් කිරීමට යළිත් මැදිහත් වීමේ ක්‍රියාවලිය ජාතික මෙන්ම ජාත්‍යන්තර සහයෝගිතාව මගින් තවදුරටත් ශක්තිමත් වේවායි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ප්‍රාර්ථනා කරයි.

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම් හා ජාත්‍යන්තර ප්‍රජාව දක්වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරාගෙන ඇති විෂය පථයට / සංරචකයන්ට අදාළ සිදුවීම් 17ක් 2022 ජනවාරි මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 5ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 7ක්, ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 5ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ජනාධිපතිවරයාට හූ කියන දර්ශන ඇතුළත් වීඩියෝවක් සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාහැරියේය යන චෝදනාව මත සමාජ ක්‍රියාකාරිනියක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.
2. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා දිවයින පුවත්පතට කර ඇතැයි කියන 'අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි' ප්‍රකාශයක් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව කරුණු විමසීම.
3. නීතිය, භාෂණයේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විවෘත සංවාදයක් හෑෂ්ටැග් පරපුරේ Facebook පිටුව හරහා සජීවීව පැවැත්වීම.
4. තොරතුරු කොමිසම දුන් නියෝගයකට එරෙහිව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා ඉදිරිපත් කළ අභියාචනා පෙත්සම පිළිබඳ නඩු විභාගයෙන් විනිසුරුවරුන් දෙදෙනෙකු ඉවත් වීම.
5. යූ ටියුබ් එල්එල්සී සමාගමට සහ කලම්බු ටුඩේ යූ ටියුබ් නාලිකාවට එරෙහිව කොළඹ දිසා අධිකරණය වාරණ නියෝගයක් නිකුත් කිරීම.
6. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමයේ (ITSSL) සභාපති යසිරු කුරුවිටගේ, 'මතයක් බෙදාගැනීමේ චෝදනාව මත' තමන් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.
7. රංගන ශිල්පියකු හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන සුදත්ත තිලකසිරි සමාජ මාධ්‍ය ඔස්සේ පළ කරන අදහස් සම්බන්ධයෙන් ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.
8. අරුණ පුවත්පතට එරෙහිව ප්‍රකට සාහිත්‍යවේදියකු හා දේශපාලන ක්‍රියාකාරිකයකු වන ගාමිණී වියන්ගොඩ විසින් පවරා තිබූ නඩුව සමථයකට පත් වීම.
9. බරපතළ දූෂණ හා අක්‍රමිකතා කිහිපයක් හෙළිදරව් කළ පාරිභෝගික අධිකාරියේ (CAA) හිටපු විධායක අධ්‍යක්ෂ තුෂාන් ගුණවර්ධන විදෙස්ගත වීම වැළැක්වීමට ආගමන හා විගමන බලධාරීන් කටයුතු කිරීම.
10. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම්ට පුත්තලම මහාධිකරණයෙන් ඇප ලබා දුන් පසුවත් තවදුරටත් රඳවා තබා ගැනීමට එරෙහිව මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
11. මාන්කුලම් උසාවි සංකීර්ණයෙන් පිටත වාර්තාකරණයක යෙදී සිටි මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන් මාන්කුලම් පොලිසියේ නිලධාරීන්ගේ බාධා කිරීමට ලක් වීම.
12. හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ "2022 ලෝක වාර්තාවේ" ශ්‍රී ලංකාව පිළිබඳ පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකා රජයේ මානව හිමිකම් චර්යාව විවේචනයට ලක් වීම හා විදේශ අමාත්‍යාංශය ඊට ප්‍රතිචාර දැක්වීම.
13. ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධයෙන් වසර 12ක් ගත වන තුරුම යුක්තිය ඉටු නොකිරීමට විරෝධය පළ කරමින් සන්ධ්‍යා එක්නැලිගොඩ හිස මුඩු කොට ආගමික ව්‍රතයක නිරත වීම.
14. නම් කරන ලද ආයතන හා ක්ෂේත්‍ර කිහිපයක සේවකයන්ගේ වැඩ වර්ජන අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තහනම් කළ යුතු බවට අධිකරණ අමාත්‍යවරයා මාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කිරීම.
15. 'ඝාතනයට, අතුරුදන්කිරීමට, ප්‍රහාරයට හා තර්ජනයට ලක් වූ මාධ්‍යවේදීන්ට යුක්තිය ඉටු කරනු' යන්න තේමා කර ගනිමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මාර්ගගත සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
16. භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය භාවිත කිරීම හේතුවෙන් ඝාතනයට, අතුරුදන් කිරීමට හා වධහිංසාවලට ලක් වූ මාධ්‍යවේදීන් අනුස්මරණය කිරීම හා ඔවුන් වෙනුවෙන් යුක්තිය ඉටු කරන ලෙස බල කිරීම අරමුණු කරගත් සමරු වැඩසටහනක්, කොළඹදී පැවැත්වීම.
17. කුරුණෑගල ලංකාදීප මාධ්‍යවේදිනී චාන්දනී දිසානායගේ මාධ්‍ය වාර්තාකරණයකට නගරසභාවේ බලධාරීන් බාධා පැමිණවීම

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 ජනවාරි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| නීතිමය කොන්දේසි | 07 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 05 |
| **එකතුව** | **17** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 5ක් ජනවාරි මාසයේදී වාර්තා විය.**

**2 වගුව: 2022 ජනවාරි: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මානසික බලපෑම් | 05 |
| **එකතුව** | **05** |

1. **ජනාධිපතිවරයාට හූ කියන දර්ශන ඇතුළත් වීඩියෝවක් සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාහැරියේය යන චෝදනාව මත සමාජ ක්‍රියාකාරිනියක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

   ජනාධිපතිවරයාට හූ තැබීමේ සිදුවීමකට අදාළ වීඩියෝවක් සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාහැරීමේ චෝදනාව මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 15 දෙනෙකුගෙන් හා නිලධාරිනියකගෙන් සමන්විත කණ්ඩායමක් පැමිණ තමන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රැගෙන ගොස් ප්‍රශ්න කළ බව සමාජ ක්‍රියාකාරිනියක වන ආශා දිල්රුක්ෂි පෙරේරා මාධ්‍ය සාකච්ඡාවක් කැඳවමින් ප්‍රකාශ කළාය. එහිදී සිය විරෝධය නොතකා තම දුරකථනයේ දත්ත සියල්ල පොලිසිය පිටපත් කරගත් බවද ඇය ප්‍රකාශ කළාය. ජනාධිපතිවරයාට අපහාස වන අන්දමේ අන්තර්ගතයක් හුවමාරු කිරීම අපරාධ වරදක් බවට එහිදී පොලිස් නිලධාරීන් පැවසුවේයැයි කියන කරුණ සනාථ කරමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පසුව කරන ලද ප්‍රකාශය අදහස් පළ කිරීමේ නිදහස පිළිබඳ තියුණු සංවාදයකට හේතු විය.

   මූලාශ්‍රය: https://www.youtube.com

2. **රංගන ශිල්පියකු හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන සුදත්ත තිලකසිරි සමාජ මාධ්‍ය ඔස්සේ පළ කරන අදහස් සම්බන්ධයෙන් ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

   රංගන ශිල්පියකු හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන සුදත්ත තිලකසිරි, සිය Talk with Sudaththa යූ ටියුබ් වැඩසටහන සහ වෙනත් සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් ඔස්සේ පළ කරන අදහස්වලින් රජය අප්‍රසාදයට ලක් කරන බවට 'රටට හිතැති කලාකරුවෝ' නැමති සංවිධානයක් විසින් කරන ලද පැමිණිල්ලකට අනුව මෙම ප්‍රශ්න කිරීම සිදුව තිබේ.

   2022-01-15 වැනිදා පැය 4ක පමණ කාලයක් ඔහුගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇති අතර, ඔහුගේ සහායට පැමිණි නීතිඥවරුන්ට එය නිරීක්ෂණය කිරීමට අවසර දී නැත.

   මූලාශ්‍ර: 1 https://divaina.lk
   2. https://www.youtube.com

3. **බරපතළ දූෂණ හා අක්‍රමිකතා කිහිපයක් හෙළිදරව් කළ පාරිභෝගික අධිකාරියේ (CAA) හිටපු විධායක අධ්‍යක්ෂ තුෂාන් ගුණවර්ධන විදෙස්ගත වීම වැළැක්වීමට ආගමන**

හා විගමන බලධාරීන් කටයුතු කිරීම.

ඇමෙරිකාව බලා පිටත්වීමට ජනවාරි 22 වැනිදා කටුනායක ගුවන්තොටුපළට ගොස් සිටියදී ආගමන විගමන බලධාරීන් ඔහුට දැනුම් දී ඇත්තේ, වැලිසර අධිකරණයේ පවරා ඇති නඩුවක සැකකරුවකු ලෙස නම් කර ඇති බැවින් ඔහුට විදෙස් ගත වීම තහනම් කර ඇති බවයි. එහෙත් එවැනි නඩුවක් හෝ විදෙස් ගමන් තහනමක් පිළිබඳව තමන් දැනුවත්ව නොසිටි බවත්, තමන් විසින්ම හෙළිදරව් කරන ලද සතොස සුදුලූනු වංචාව පිළිබඳ නඩුවේ සැකකරුවකු ලෙස නම් කර ඇති බව පසුව දැනගන්නට ලැබුණු බවත් තුෂාන් ගුණවර්ධන මාධ්‍ය හමුවක් පවත්වමින් ප්‍රකාශ කළේය.

මේ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරන බවද, සතොස සුදුලූනු වංචාව හෙළිදරව් කිරීමෙන් පසුව තමන්ට එල්ල වූ මරණ තර්ජන පිළිබඳ සියලු තොරතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇතත් මේ වන තෙක් කිසිදු පියවරක් ගෙන නැති බවද ඔහු පැවසුවේය.

මූලාශ්‍රය: https://island.lk

4. **මාන්කුලම් උසාවි සංකීර්ණයෙන් පිටත වාර්තාකරණයක නිරතව සිටි මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන් මාන්කුලම් පොලිසියේ නිලධාරීන්ගේ බාධා කිරීමට ලක් වීම.**

මාන්කුලම් අධිකරණයේ පැවති නඩුවකට අදාළ වාර්තාකරණයක් සඳහා ජනවාරි 29 වැනිදා අධිකරණ භූමියෙන් පිටත සිට එහි නාමපුවරුව රූ ගත කරමින් සිටියදී එම කාර්යය වළක්වා මෙම බාධා කිරීම සිදු කර තිබේ. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සිය මාධ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කළ විට අධිකරණ නිලධාරීන්ට ඉදිරිපත් කිරීම සඳහා එය රැගෙන ගිය බවද, පොලිස් නිලධාරීන්ගේ ජංගම දුරකථනවලින් තමන්ව ඡායාරූපගත කළ බවද ඔහු ප්‍රකාශ කරයි. මේ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන බවද මාධ්‍යවේදියා ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

5. **කුරුණෑගල ලංකාදීප මාධ්‍යවේදිනී චාන්දනී දිසානායගේ මාධ්‍ය වාර්තාකරණයකට නගරසභාවේ බලධාරීන් බාධා පැමිණවීම**

කුරුණෑගල සති පොළේ කසළ ගැටලුව පිළිබඳ වීඩියෝ දර්ශන ලබාගනිමින් සිටියදී සති පොළේ සේවකයින් ඇයට බාධා කොට ඇගේ වාර්තාකරණය වළක්වා ඇති අතර ජනතාව ඉදිරියෙහි ඇයව අපහසුවට පත් වන අයුරින් ක්‍රියා කර ඇත. මේ පිළිබඳව නාගරික කොමසාරිස්වරයා දැන්වත් කළ විට, කසළ වුවද නගර සභාවේ දේපළක් බවත්, සති පොළ ගැන වාර්තා කිරීමට නගර සභාවෙන් අවසර ගත යුතු බවත් එම නිලධාරියා ප්‍රකාශ කළ බව මාධ්‍යවේදිනිය නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත දැනුම් දී තිබේ.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 7ක් ජනවාරි මාසය තුළ නිරීක්ෂණය විය. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගේ ප්‍රකාශයක් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම විසින් පරීක්ෂණයක් ආරම්භ කිරීම, අයිතිවාසිකම් කඩවූවන් කිහිප දෙනෙකු ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට ඉදිරිපත් වීම ඒ අතරින් සාධනීය සිදුවීම් ලෙස කැපී පෙනෙයි.**

**3 වගුව: 2022 ජනවාරි: නීතිමය කොන්දේසි - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 05 |
| තොරතුරු දැනගැනීමේ අයිතිය | 01 |
| නීති ප්‍රතිසංස්කරණ යෝජනා | 01 |
| **එකතුව** | **07** |

1. **පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා දිවයින පුවත්පතට කර ඇතැයි කියන 'අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි' ප්‍රකාශයක් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව කරුණු විමසීම.**

ජනාධිපතිවරයාට අපහාස වන ප්‍රකාශයක් සිදු කිරීම හෝ හුවමාරු කිරීම කළ නොහැකි බවට පොලිස් මාධ්‍ය ප්‍රකාශක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දුව විසින් ජනවාරි 03 වැනිදා දිවයින පුවත්පතට කරන ලදැයි

කියන ප්‍රකාශයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ඔහුගෙන් කරුණු විමසන ලදි. තමන් එබඳු ප්‍රකාශයක් නොකළ බවත්, දිවයින කතුවරයාට ඒ බව ලිඛිතව දන්වා ඇති බවත් මාධ්‍ය ප්‍රකාශකවරයා මානව හිමිකම් කොමිසම හමුවේ ප්‍රකාශ කර ඇති අතර, ඒ බව දිවුරුම් ප්‍රකාශයකින් දැනුම් දෙන ලෙස කොමිසම උපදෙස් දී තිබේ.

ජනාධිපතිවරයාට හූ කීමේ සිදුවීමකට අදාළ වීඩියෝ දර්ශනයක් සමාජ මාධ්‍ය ඔස්සේ බෙදා හැරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කාන්තාවකගෙන් ප්‍රශ්න කිරීම පිළිබඳව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා උපුටා දක්වමින් දිවයින පුවත්පත අදාළ පුවත පළ කර තිබිණි.

මූලාශ්‍රය: https://medialk.com

2. **තොරතුරු කොමිසම දුන් නියෝගයකට එරෙහිව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා ඉදිරිපත් කළ අභියාචනා පෙත්සම පිළිබඳ නඩු විභාගයෙන් විනිසුරුවරුන් දෙදෙනෙකු ඉවත් වීම.**

වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය එම තොරතුරු ඉල්ලා සිටි අයදුම්කරුට ලබා දෙන්නැයි තොරතුරු කොමිසම දුන් නියෝගයකට එරෙහිව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා අභියාචනාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම ජනවාරි 11 වැනිදා කැඳවනු ලැබිණි.

එහිදී අභියාචනාධිකරණ විනිසුරුවරු දෙපළක් අදාළ නඩු විභාගයෙන් ඉවත් වන බව දැනුම් දුන් අතර, අදාළ පෙත්සම අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුවරයා වෙත යොමු කෙරිණි.

ශ්‍රී ලංකා තොරතුරු කොමිසම වගඋත්තරකරු ලෙස නම් කරමින් පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක සහ නියෝජ්‍ය මහලේකම් කේ.ඒ. රෝහණදීර විසින් මෙම පෙත්සම ගොනු කර තිබේ. තොරතුරු කොමිසමේ නියෝගය නීතියට පටහැනි යැයි කියා සිටින පෙත්සම්කරුවෝ, එම නියෝගය බල රහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටිති.

මූලාශ්‍ර: 1. https://ceylontoday.lk
2. http://www.rticommission.lk

3. **'යූ ටියුබ් එල්එල්සී' සමාගමට සහ 'කලම්බු ටුඩේ' යූ ටියුබ් නාලිකාවට එරෙහිව කොළඹ දිසා අධිකරණය වාරණ නියෝගයක් නිකුත් කිරීම.**

කැලිෆෝනියාවේ මව් සමාගම පිහිටි 'යූ ටියුබ් එල්එල්සී' සමාගම සහ 'කලම්බු ටුඩේ' යූ ටියුබ් නාලිකාව ශ්‍රී ලංකාවේ රුසියානු අධ්‍යාපන මධ්‍යස්ථානයේ (REC කැම්පස්) කීර්ති නාමයට කැළලක් විය හැකි අපහාසාත්මක වීඩියෝවක් යූ ටියුබ් හි පළ කිරීම වළක්වාලමින් කොළඹ දිසා අධිකරණය ජනවාරි 04 වැනිදා වාරණ නියෝගයක් නිකුත් කළේය.

'පැමිණිලි සහ නීතිමය දැනුම්දීම් නොතකමින් විත්තිකරුවන් අදාළ වීඩියෝ පටය ඉවත් කිරීම නොසැලකිලිමත් ලෙස ප්‍රතික්ෂේප කිරීම' හේතුවෙන් විත්තිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට තමන්ට බලකෙරුණු බව පැමිණිලිකරු කියා සිටී. අදාළ නඩුව 2022 මාර්තු 23 දින යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: https://counterpoint.lk

4. **ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමයේ (ITSSL) සභාපති යසිරු කුරුවිටගේ, 'මතයක් බෙදාගැනීමේ චෝදනාව මත' තමන් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.**

ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළු "gov.lk" වෙබ් අඩවිවලට සයිබර් ප්‍රහාර එල්ල කිරීමේ ඇතැම් සිද්ධීන් සම්බන්ධයෙන් විශේෂ මතයක් දැරීම හේතුවෙන් තමන් අත්අඩංගුවට ගැනීම, සිය සිතීමේ නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීමක් බව පෙත්සම්කරු කියා සිටී.

2021 ජුනි 07 වැනි දා තමන් අත්අඩංගුවට ගත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අනිසි ප්‍රමාදයකින් තොරව තමන් මහේස්ත්‍රාත්වරයකු හමුවට ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ බවද, විමර්ශන අවසන් වන තෙක් විත්තිකරු රිමාන්ඩ් භාරයේ තබන ලෙසට, පැමිණිල්ල විසින් සාවද්‍ය අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවද, ඇප ලැබීමෙන් පසුවත් පීසීආර් පරීක්ෂණයක අවශ්‍යතාව මත තවදුරටත් රිමාන්ඩ් භාරයේ තබාගත් බවද ඔහු වැඩිදුරටත් කියා සිටී. අත්අඩංගුවට ගත් සිය ලැප්ටොප් පරිගණකය හා ජංගම දුරකථනය දින නියමයක් නොමැතිව නිදහස් කර ගැනීමට නොහැකි වී ඇති බවද අදාළ පෙත්සමෙහි සඳහන් කර ඇත.

මූලාශ්‍රය: https://counterpoint.lk

5. **අරුණ පුවත්පතට එරෙහිව ප්‍රකට සාහිත්‍යවේදියකු හා දේශපාලන ක්‍රියාකාරිකයකු වන ගාමිණී වියන්ගොඩ විසින් පවරා තිබූ නඩුව සමථයකට පත් වීම.**

"පුරවැසි බලය ඇත්තෝ යහපාලනෙන් ගොඩේ ගොඩ-දඹර අමිල, සරත් විජේසූරිය, ගාමිණී වියන්ගොඩ හා සමන් රත්නප්‍රිය හම්බ කරගත් හැටි" යන ශීර්ෂ පාඨය යටතේ, 'සති අග අරුණ' පුවත්පතෙහි 2018-12-09 වැනි දින පළ වූ පුවත් වාර්තාවකින් තමාට බලවත් අසාධාරණයක් සිදුව ඇතැයි ගාමිණී වියන්ගොඩ විසින් 'ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්' ආයතනය, අරුණ පුවත්පතේ කර්තෘ මහින්ද ඉලේපෙරුම හා මාධ්‍යවේදිනී

සුරේඛා සමරසේනට එරෙහිව එම නඩුව පවරනු ලැබ තිබිණි.

ජනවාරි 18 වැනිදා කොළඹ දිසා විනිසුරු අරුණ අලුත්ගේ ඉදිරියේ එම පෙත්සම විභාගයට ගත් අවස්ථාවේදී 'අදාළ සිද්ධිය සම්බන්ධයෙන් 'අරුණ' පුවත්පතේ සමාව ගැනීමේ නිවේදනයක් පළ කිරීමේ කොන්දේසිය මත' නඩුව සමථයකට පත් විය.

මූලාශ්‍රය: https://theleader.lk

6. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම්ට පුත්තලම මහාධිකරණයෙන් ඇප ලබා දුන් පසුවත් තවදුරටත් රඳවා තබා ගැනීමට එරෙහිව මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.**

කාව්‍ය සංග්‍රහයක් ලියා පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 18 කට වැඩි කාලයක් රඳවාගෙන සිටි කවියකු හා ගුරුවරයකු වන අහ්නාෆ් ජසීම්, ජනවාරි 5 වැනිදා මානව හිමිකම් කොමිසමේ පුත්තලම කාර්යාලය වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කර තිබේ.

පසුගිය 2021 දෙසැම්බර් 15 වැනි දින පුත්තලම මහාධිකරණයෙන් ඔහුට ඇප ලබා දුන් අතර, අදාළ ඇප කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසුවත් තවත් පැය 24කට වැඩි කාලයක් අත්අඩංගුවේ තබා ගත් බවට එම පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

මූලාශ්‍රය: https://www.twitlonger.com

7. **නම් කරන ලද ආයතන හා ක්ෂේත්‍ර කිහිපයක සේවකයන්ගේ වැඩ වර්ජන අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තහනම් කළ යුතු බවට අධිකරණ අමාත්‍යවරයා මාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කිරීම.**

වරාය, රේගුව, ජල සම්පාදන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව හා වෛද්‍ය යන වෘත්තීය ක්ෂේත්‍රවලට වැඩ වර්ජනය කිරීමේ අයිතිය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අහෝසි කළ යුතු බව අධිකරණ අමාත්‍ය අලි සබ්රි, ජනවාරි 27 වැනිදා නෙත් එෆ් එම් නාලිකාව සමග පැවති සංවාදයකදී ප්‍රකාශ කළේය.

මෙම ප්‍රකාශයට දැඩි ලෙස විරෝධය පළ කරමින් වෘත්තීය සංවිධාන 11කින් සැදුම්ලත් ජාතික කම්කරු උපදේශක සභාව නිවේදනයක් නිකුත් කළේය. "වැඩ වර්ජනය කිරීමේ අයිතිය හා සාමූහිකව කේවල් කිරීමේ අයිතිය විශ්ව අයිතීන් බවද ඒවා සුරැකීමට අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පමණක් නොව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 87 හා 98 සම්මුතීන්ගෙන් සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රකාශනයෙන්ද අප රටක් වශයෙන් බැඳී සිටින බවද" එම නිවේදනය අවධාරණය කරයි. හිටපු කතානායක කරු ජයසූරිය ප්‍රමුඛ 'සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය' විසින් නිකුත් කරන ලද නිවේදනයෙහි දැක්වෙන්නේ මෙම ප්‍රකාශය ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් බවයි.

මූලාශ්‍ර: 1. https://theleader.lk

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය ලබා දීම' යන දර්ශකයට අයත් වන අවස්ථා 5ක් ජනවාරි මාසයේදී නිරීක්ෂණය විය. ඝාතනයට හා අතුරුදන් කිරීමට ලක් වූ මාධ්‍යවේදීන් අනුස්මරණය කෙරෙන 'කළු ජනවාරිය' නිමිත්තෙන් ක්‍රියාකාරී වැඩසටහන් කිහිපයක්ම පැවැත්වීමත්, යුක්තිය පමා වීම සම්බන්ධයෙන් සන්ධ්‍යා එක්නැලිගොඩ විසින් ගනු ලැබූ ආන්දෝලනාත්මක පියවරත් ඒ අතරින් කැපී පෙනෙයි.**

**4 වගුව: 2022 ජනවාරි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 05**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 05 |
| **එකතුව** | **05** |

1. **නීතිය, භාෂණයේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විවෘත සංවාදයක් හැෂ්ටැග් පරපුරේ Facebook පිටුව හරහා සජීවීව පැවැත්වීම.**

   'හූ කිව්වොත් හිරේද?' මැයෙන් ජනවාරි 09 වැනිදා පැවති මෙම සංවාදය සඳහා ආසන්න නිමිති වූයේ ජනාධිපතිවරයාට හූ කීමේ සිදුවීම හා පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඒ පිළිබඳ කරන ලද ප්‍රකාශයයි.

   නීතිඥ තිෂ්‍ය වේරගොඩ, නීතිඥ අර්මිසා ටීගල් සහ නීතිඥ නෙත්මිණි මැදවල එහිදී අදහස් දැක්වූහ.

   එම වැඩසටහන: https://www.facebook.com

2. **හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ "2022 ලෝක වාර්තාවේ" ශ්‍රී ලංකාව පිළිබඳ පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකා රජයේ මානව හිමිකම් චර්යාව විවේචනයට ලක් වීම හා විදේශ අමාත්‍යාංශය ඊට ප්‍රතිචාර දැක්වීම.**

   සුළුතර ජනවර්ගවල මානව හිමිකම් උල්ලංඝනය කිරීම, සමාජ ක්‍රියාකාරිකයන් මර්දනය කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මර්දනකාරී ලෙස යොදාගැනීම, නීති ප්‍රතිසංස්කරණ සඳහා වූ පොරොන්දු කඩ කිරීම ආදී කරුණු අදාළ වාර්තාවෙන් අවධාරණය කර ඇති අතර ශ්‍රී ලංකා රජයේ ප්‍රතිචාරය වී ඇත්තේ එය 'පක්ෂග්‍රාහී වාර්තාකරණයක්' බවයි. අදාළ වාර්තාව "රටේ වත්මන් මානව හිමිකම් තත්ත්වය අතිශයෝක්තියෙන් යුක්තව අනවශ්‍ය හා සෘණාත්මක අයුරින් නිරූපණය කර ඇති බව විදේශ අමාත්‍යාංශය කනගාටුවෙන් දන්වා සිටියි" යනුවෙන් විදේශ අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳව නිකුත් කළ නිවේදනයෙහි දැක්වේ.

   මූලාශ්‍ර: 1. https://www.hrw.org
   2. https://mfa.gov.lk

3. **ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධයෙන් වසර 12ක් ගත වන තුරුම යුක්තිය ඉටු නොකිරීමට විරෝධය පළ කරමින් සන්ධ්‍යා එක්නැලිගොඩ හිස මුඩු කොට ආගමික ව්‍රතයක නිරත වීම.**

   මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කර වසර 12 සපිරුණු ජනවාරි 24 වැනිදා නවගමුව පත්තිනි දේවාලයේ ආගමික වතාවතක නිරත වූ සන්ධ්‍යා එක්නැලිගොඩ, 25 වැනිදා මෝදර මුහුදු වෙරළේදී ප්‍රසිද්ධියේ හිස මුඩු කොට කාලි කෝවිලේදී 'විරදම් පූජාව' නම් ආගමික ව්‍රතයක නිරත විය. තම සැමියා වෙනුවෙන් අධිකරණය මගින් යුක්තිය ඉටු කර ගැනීමට දොළොස් වසරක් තිස්සේ උත්සාහ දැරූ අතර ඒ පිළිබඳව විශ්වාසය පළුදු වී ඇති බැවින් මෙම පියවර ගත් බවත්, වරදකරුවන්ට සොබාදහමින් දඬුවම් ලැබෙතැයි අපේක්ෂා කරන බවත් ඇය ප්‍රකාශ කරයි. මානව හිමිකම් පිළිබඳ සම්මානලාභිනියක වන ඇගේ මෙම පියවර ජාතික හා ජාත්‍යන්තර තලයේ දැඩි අවධානයට ලක් විය.

   මූලාශ්‍රය: https://www.vikalpa.org

4. **'ඝාතනයට, අතුරුදන්කිරීමට, ප්‍රහාරයට හා තර්ජනයට ලක් වූ මාධ්‍යවේදීන්ට යුක්තිය ඉටු කරනු' යන්න තේමා කර ගනිමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මාර්ගගත සම්මන්ත්‍රණයක් පැවැත්වීම.**

   නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් වාර්ෂිකව පවත්වන 'කළු ජනවාරිය' සමරු වැඩසටහනට වෙනුවෙන් ජනවාරි 26 වැනිදා පැවති මෙම සම්මන්ත්‍රණයේදී 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ සැඟවෙන මාධ්‍ය මර්දනය' පිළිබඳව නීතිඥ අර්මිසා ටීගල් 'ICCPR අවභාවිතයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය' පිළිබඳව නීතිඥ ප්‍රබෝධ රත්නායක, 'රාජ්‍ය ආරක්ෂාව හා දෙමළ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව' පිළිබඳව උදයන් පුවත්පතේ හිටපු කර්තෘ තේවනායගම් ප්‍රේමිනාත් සහ 'ගවේෂණාත්මක මාධ්‍යවේදීන් ආවේක්ෂණය හා දඩයම' පිළිබඳව මාධ්‍යවේදී ලසන්ත රුහුණගේ අදහස් දැක්වූහ.

   මෙම සංවාදය ආරම්භයේදී ඒ සඳහා මාර්ගගතව සම්බන්ධ වී සිටි සංවිධානාත්මක පිරිසකගෙන් ඊට දැඩි බාධා එල්ල විය.

   මූලාශ්‍රය: https://theleader.lk

5. **භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය භාවිත කිරීම හේතුවෙන් ඝාතනයට, අතුරුදන් කිරීමට හා වධහිංසාවලට ලක් වූ මාධ්‍යවේදීන් අනුස්මරණය කිරීම හා ඔවුන් වෙනුවෙන් යුක්තිය ඉටු කරන ලෙස බල කිරීම අරමුණු කරගත් සමරු වැඩසටහනක්, කොළඹදී පැවැත්වීම**

   'අමතක නොකරමු' යන තේමාව යටතේ ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය හා අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ සංවිධානයේ මෙහෙයවීමෙන් ජනවාරි 31 වැනිදා කොළඹ විහාරමහාදේවී උද්‍යානය අසල දී පැවති මෙම වැඩසටහනට මාධ්‍යවේදීන් සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් හා කලාකරුවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ. වීදි නාට්‍ය, ගායනා සහ ඉටි පහන් දල්වා මියගිය හා අතුරුදන් වූ මාධ්‍යවේදීන් අනුස්මරණය කිරීමක් මෙම වැඩසහනට ඇතුළත් විය.

   මූලාශ්‍රය: https://sinhala.lankanewsweb.net

**5 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි - දෙසැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - දෙසැම්බර් | | 2022 ජනවාරි |
|---|---|---|---|
| | පෙර සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 51 | | 05 |
| නීතිමය කොන්දේසි | 45 | 13 | 07 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 03 | | - |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 14 | | 05 |
| වෘත්තීයවේදීත්වය | 02 | | - |
| **එකතුව** | **116** | **13** | **17** |

2021 මාධ්‍ය නිදහස මාසික වාර්තා ජනවාරි-දෙසැම්බර් දක්වා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25